# පළවැනි පරිච්ඡේදය

# පළවැනි අදියර

# අරමුණු සහ අන්තර්ගතය

## 1.1 අරමුණු

නව භාෂාවක් උගැන්වීමෙදී පළමුව අප ජීවත්වන, සාමාන්‍ය ජීවිතයෙහිදී සුලබ ලෙස භාවිතා වන යෙදුම්, වචන හඳුන්වාදීම සිදු කෙරෙයි. මෙහිදී චීන භාෂාව පරිහරණයේදී අපට හමුවන ශබ්ද සහ වචන උච්චාරණය හඳුන්වාදීමටත්, ඒ මඟින් සරළ වගන්ති සෑදීමට පුහුණු කරවීම අපේක්ෂිතයි.

චීන භාෂාව උගැන්වීමෙදී බස හැසිරවීමට, අධ්‍යයනයට සහ උගැනුමට භාවිතා වන විවිධ උපායයන් පිළිබඳව මූලික දැණුමක් ලබාදීමටත් ඒ මඟින් බස උගැනීමට කැමැත්තක් ඇතිකරවීමත් චීන සංස්කෘතිය සමාජ චර්යා පිළිබඳව සරළ විඥානයක් ඇතිකරවීමත් අරමුණු ලෙස තවදුරටත් සනිටුහන් කල හැක.

## 1.2 භාෂාමය ඥානය

| දැනුම | විස්තරාත්මක අරමුණු |
|---|---|
| වාග් පුහුණුව | 1. මූලික ශබ්දයනට සවන්දී ඒ ශබ්ද වෙන වෙනම හඳුනා ගැනීම සහ නිවැරදි අයුරෙන් උච්චාරණය කිරීමට පුහුණුව.<br>2. චීන අක්ෂරයන්හි උච්චාරණයන් හඳුනාගැනීමට පුහුණුව.<br>3. චීන භාෂාව පරිහරණයෙදී ස්වර 4ක් භාවිත වන බව දැන සිටීම. |
| අක්ෂර සහ වචන | ගුරුවර මගපෙන්වීම යටතේ......<br>1. සුලබ ලෙස භවිතා වන අක්ෂර 150ක් කියවීමට ලිවීමට මනාව පුරුදු වීම.<br>2. අක්ෂරයන්හි මූලික සංරචක හඳුනා ගැනීම.<br>3. අක්ෂර ලියනා රටාව සහ පිළිවෙල දැන සිටීම.<br>4. අක්ෂර සහ වචන අතර සබඳතාවය මනාව දැන සිටීම.<br>5. සාමාන්‍ය ජීවිතයෙහිදී සහ පාසැලෙහිදී හමුවන වචන 300 පමණ මනාව දැන සිටීම. |
| ව්‍යාකරණ කරුණු | අවබෝධ කර ප්‍රගුණ කිරීම:<br>1. පොදු වාක්‍ය රටා, සාමාන්‍ය ප්‍රශ්න සහ නැත යන අර්ථය දෙන වාක්‍ය පිළිබඳ දැනුම.<br>2. නාම පද, සංඛ්‍යාංක සහ පොදු විභාගදර්ශක පිළිබඳ දැනුම.<br>3. පුද්ගල සර්වනාම සහ උපපාදක පිළිබඳ දැනුම.<br>4. සකර්මක ක්‍රියා, අකර්මක ක්‍රියා සහ නාම පද පිළිබඳ දැනුම.<br>5. නාම විශේෂණ, ක්‍රියා විශේෂණ පිළිබඳ දැනුම. |

http://www.purpleculture.net



| දැනුම | විස්තරාත්මක අරමුණු |
|---|---|
| සන්නිවේදන ක්‍රියාකාරකම් | 1. ප්‍රධාන සන්නිවේදන ක්‍රම (සුභ පැතුම්, ස්තුති කිරීම්, සමාව ගැනීමට, සහ සමු ගැනීමට) පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම.<br>2. එදිනෙදා සිදුවන සන්නිවේදනයන් උසස් ලෙස කෙරුමට අංග චලන ආදිය යොදා ගැනීම. |
| තේමාවන් | 1. මූලික සහ සරල සමාජ අන්තර් ක්‍රියා පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම.<br>2. පුද්ගලික ජීවිතය, පවුල සහ විනෝදාංශ වැනි සරල මාතෘකා පිළිබඳ දැනුම.<br>3. එදිනෙදා ජීවිතයේදී අවශ්‍ය වන අංක, වෙලාව, දින සහ මුදල් පිළිබඳ මූලික දැනුමක් ලබා ගැනීම. |
| කථනය | මඟ පෙන්වීම යටතේ......<br>1. දීර්ග පරිච්ඡේද සඳහා යොදා ගත යුතු වාක්‍ය නිසි ආකාරව සුදුසු තැන්හි සුදුසු ලෙස යොදා ගැනීමට දැන ගැනීම.<br>2. වාක්‍යයකින් දැක්වෙන ඍජු තේරුම සහ එහි සඳහන් වන ක්‍රියා පද, නාම පද පිළිබඳ අවබෝධය.<br>3. යම් දෙයක් පිළිබඳව තම මව් බසින් සිතන විට සහ එම දෙයම චීන බසින් සිතන විට සිතීමේදී ඇතිවන සමාන අසමානතා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.<br>4. යමක් පිළිබඳව ප්‍රත්‍යක්ෂ කිරීමට හැකිවීම.<br>5. චීන භාෂාව කථනයේදී හා ලිවීමේදී හැඟීම් ඉදිරිපත් කරන විවිධ ආකාර ගැන තේරුම් ගැනීම. |



## 1.3 භාෂා හුරුව

| කුසලතා | | විස්තරාත්මක අරමුණු |
|---|---|---|
| භාෂා ව්‍යවහාර කුසලතා | | මූලික සරල සීමිත භාෂා කරුණු පුද්ගලික දෛනික ක්‍රියාකාරකම් කෙරෙහි සමීපව ඇත. අංගචලන භාෂාවක් ඔපවත් කිරීමට නිතර උපකාර වේ. උපාංග අරමුණු සුදුසු සටහන් මාතෘකා සහ දෛනික ආචාර ධර්ම ඔවුනොවුන් හෝ අන් අය සමඟ සන්නිවේදනය කිරීම ඉතා සීමිත වාග්මාලාවකින් හඳුන්වා දෙනු ලැබේ. |
| විශේෂිත | ඇහුම්කන් දීම | මූලික වූ හුරුපුරුදු නිවැරදි වචන උච්චාරණය සරල වගන්ති සහ පන්ති ප්‍රකාශන මඟින් පුද්ගලික සහ දෛනික ක්‍රියාකාරකම් අවබෝධ කල හැක.එමෙන්ම අංගචලන වලින් හෝ අනුමත කල හැකිවන පරිදි කෙටි ප්‍රකාශන දෛනික හා පුද්ගලික ලෙස පරිහරණය කිරීමෙන් කථනයේ අර්ථය අනුමාන ලෙස හෝ පැවසීමේ හැකියාව ලබාගත හැක.<br>ඒ සඳහා... |

http://www.purpleculture.net



| කුසලතා | | විස්තරාත්මක අරමුණු |
|---|---|---|
| විශේෂිත | **ඇහුම්කන් දීම** | 1. ඉතා සීමිත කෙටි ප්‍රකාශන දෛනික හා පුද්ගලික ලෙස පරිහරණය.<br>2. මූලිකාංග.<br>3. සරළ ආචාර විධි සහ ජනතාව සමඟ සන්නිවේදනය කරණ ක්‍රම.<br>4. පන්ති කාමරයෙහි මූලික උච්චාරණ පුහුණුව සඳහා උපදෙස් ලබා ගැනීම.<br>5. සරළ ලෙස යමෙකුට, යමක් සඳහා ආරාධනා කිරීමට හෝ ආයාචනා කිරීමට දැන සිටීම, යන කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. |
| | **කථනය** | කථන නිපුණත්වය ලබා ගැනීම උදෙසා නැවත නැවත කියවීම, නිසිලෙස වචන සහ වාක්‍ය උච්චාරණය, සාමාන්‍ය ජීවිතයේදී ද සරළ වාක්‍ය කාණ්ඩ භාවිත කිරීම වැනි ක්‍රම උපයෝගී කරගත හැක. එමඟින් ඔවුනොවුන් විසින් මූලික පුද්ගලික තොරතුරු හුවමාරු කිරීමේ හැකියාවක් ලබා ගත යුතුය. ඒ සඳහා අංග චලනයන් අවශ්‍ය තැන්හිදී උපයෝගී කරගත හැක.<br>එමඟින්<br>1. සුදුසු ස්වරයෙන් වචන සහ වාක්‍ය උච්චාරණයට.<br>2. තම තමන්ගේ පුද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීමට.<br>3. සුබ පැතීමට සහ එම සුබ පැතුම් සඳහා ප්‍රතිචාර දැක්වීමට.<br>4. සරල ඉගැන්වීම් සහ විධානයන් සඳහා ප්‍රතිචාර දැක්වීමට.<br>5. යමක් සඳහා හෝ යමෙකුට ආරාධනා කිරීමට, ආයාචනා කිරීමට සහ උපකාරයක් ඉල්ලීමට.<br>පුහුණුවක් ලබාතිබිය යුතුය. |
| | **කියවීම** | පුද්ගලික තොරතුරු දැක්වීම සඳහා *pinyin* හඳුනා ගැනීම සහ සරළ අක්ෂර, වාක්‍ය සහ අංක පිළිබඳ දැනුමක් ඇති කර ගැනීම වැදගත් වේ.<br>ඒ සඳහා...<br>1. ශබ්ද කෝෂයේ උපකාරය සහිතව *pinyin* හඳුනාගැනීම සහ චීන අක්ෂර සඳහා *pinyin* නිවැරදි ලෙස යොදා ගැනීම.<br>2. පුද්ගලික සමාජයීය සම්බන්ධතා වලින් විශේෂිත සහ නිශ්චිත තොරතුරු උපුටා ගැනීම.<br>3. දෛනික ජීවිතයේදී යොදා ගැනෙනා පොදු ආචාර ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.<br>4. දෛනික චර්යාවේදී යොදා ගන්නා පොදු සහ මූලික අක්ෂර, වචන සහ වාක්‍ය හඳුනා ගැනීම.<br>5. පින්තූර උපයෝගී කර ගනිමින් සුලබව දක්නා උපදේශන පිළිබඳ දැනුමක් ලබා ගැනීම වැදගත් වේ. |

http://www.purpleculture.net



| කුසලතා | | විස්තරාත්මක අරමුණු |
|---|---|---|
| විශේෂිත | ලිවීම | පංති කාමරයේ දී තරමක් නිවැරදිව හෝ ඉගෙනගන්නා ලද මූලික අක්ෂර ලිවීමට හැකි වීම. එය භාවිතයෙන් සරල වාක්‍යාන්ෂ සහ වාක්‍ය ගොඩ නැංවීමට හැකියාව ලබා ගැනීම.<br>එහිදී..<br>1. නිවැරදි පිළිවෙලට අක්ෂර බලා ලිවීම.<br>2. ආකෘති පත්‍ර සඳහා නම, ජාතිය ආදී කරුණු යොදන ආකාරය දැන ගැනීම.<br>3. දිනය වෙලාව සහ අංකනයන් පිළිබඳ දැනුමක් ලබා ගැනීම.<br>4. තමාගේම නිර්මාණයන් සඳහා තමා විසින්ම කුඩා වාක්‍ය නිර්මාණය කර යොදා ගැනීම වැදගත් වේ. |

## 1.4 භාෂා පරිහරණ උපාය



| නිපුණතාවය | විස්තරාත්මක අරමුණු |
|---|---|
| ක්‍රියාකාරකම් | 1. චීන භාෂා ඉගෙනුමට රුචිය ගොඩ නැංවීම.<br>2. චීන භාෂාව භාවිත කිරීමට කැමැත්තක් සහ භාවිත කිරීමට විශ්වාසයක් ගොඩනැගීම.<br>3. භාෂාව භාවිතයේදී සිදුවන වැරදි හමුවේ පසුබට නොවීම. |
| ඉගෙනීම | 1. සරල වර්ග කිරීම ක්‍රම සොයාගැනීම සහ එම වර්ගකිරීම් සඳහා උපායමාර්ග සොයාගැනීම.<br>2. ගුරුවරයාගේ උච්චාරණ ක්‍රම අනුකරණය කිරීම.<br>3. පෙර ඉගෙනගත් දේ නව දැනුම සමඟ සම්බන්ධ කර භාවිත කිරීම.<br>4. තනි තේරුම් සහිත වචන යොදා ගනිමින් වාක්‍ය සැදීම.<br>5. තමාගේ දැනුම නැවත පුනරීක්ෂණය කරමින් එම දැනුම මඟින් නව යෝජනා සඳහා ප්‍රතිචාර දැක්වීම.<br>6. තමාගේ පාඩම් සැලසුම් තමාම සැලසුම් කර ගැනීම.<br>7. ගැටළු අවස්ථාවන්හිදී අන් අයගේ උදව් උපකාර ලබා ගැනීම. |
| සන්නිවේදනය | 1. සරළ සමාජ නිපුණතා භාෂා ඉගෙනුම දියුණු කිරීමට මෙන්ම චීන ජනතාවගේ පොදු හැසිරීම් රටා සහ පුහුණුවීම් පිළිබඳ අධ්‍යනය කර අවබෝධයක් ලබා ගැනීම.<br>2. ගුරුවර මගපෙන්වීම යටතේ පන්තියේ සිසුන් චීන සංස්කෘතියේ පොදු අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.<br>3. ගුරුවර මගපෙන්වීම යටතේ සන්නිවේදනයට අංගවලන උපයෝගී කර ගැනීම.<br>එමඟින් එකිනෙකා අතර සන්නිවේදනය කර ගත හැක. |

http://www.purpleculture.net



| නිපුණතාවය | විස්තරාත්මක අරමුණු |
|---|---|
| සම්පත් උපයෝගී කර ගැනීම | 1. ගුරුවර මගපෙන්වීම යටතේ පාඨ ග්‍රන්ථ, පින්තූර සහ බහු මාධ්‍ය සම්පත් මඟින් තොරතුරු සොයා ගැනීම.<br>2. ගුරුවර මගපෙන්වීම සහ එකිනෙකා අතර අන්තර් සම්බන්දතා මඟින් අධ්‍යාපනය දියුණු කිරීම. |
| ස්වයන්පාලනය | 1. ගුරුවර මඟපෙන්වීම, පුද්ගලික මගපෙන්වීම යටතේ අනෙකුත් විෂයන් ඉගෙනුමට චීන භාෂාව සහ සංස්කෘතිය උපයෝගී කර ගැනීම.<br>2. අනෙකුත් විෂයන් ඉගෙනුමේදී චීන භාෂාව උපයෝගිවන ආකාරය පිළිබඳ සබඳතාවය වටහා ගැනීම.<br>3. මෙම අදියර මඟින් ඉතිහාසය, රංගනය, ජන කතා ආදිය පිළිබඳ දැනුම ලබා ගැනීම ආවරණය කර ගත හැක. |

## 1.5 සංස්කෘතික සවිඥානය

| නිපුණතාවය | විස්තරාත්මක අරමුණු |
|---|---|
| සංස්කෘතික දැනුම | 1. විවිධ භාෂා නිපුනත්වයේ වටිනාකම දැන ගැනීම.<br>2. තම ජාතියෙහි සහ චීන භාෂා සංස්කෘතිය පිළිබඳ දැනුම.<br>3. චීන සංස්කෘතියට ආවේනික අහර සහ ඇඳුම් පැළඳුම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.<br>4. සරළ චීන කතන්දර අවබෝධ කර ගැනීම.<br>5. භාවිත වන සහ නොවන චීන සංස්කෘතික සන්නිවේදනයන් ඉගෙනුම.<br>6. චීන භාෂාවේ සරළ සමාජ චාරිත්‍ර පිළිබඳ අවබෝධය.<br>7. චීන සංස්කෘතියෙහි අන්තර් සහ පුද්ගලික සම්බන්ධතා පිළිබඳ අවබෝධය. |
| චීන සංස්කෘතිය පිළිබඳ අවබෝධය | 1. චීන සංස්කෘතියේ දියුණුව පිළිබඳ වැටහීම.<br>2. පළපුරුදු චීන සංස්කෘතික සිද්ධාන්ත සහ සම්පත් පිළිබඳ අවබෝධය.<br>3. චීන සංස්කෘතියේ වටිනාකම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම.<br>4. සංස්කෘතික විවිධත්වයේ විවිධ අත්දැකීම් ලබා ගැනීම. |
| සංස්කෘතිය හරහා දැනුම ලබා ගැනීම | 1. තම සංස්කෘතියේ සහ චීන සංස්කෘතියේ ඇති සමාන අසමානතා පරික්ෂා කිරීම.<br>2. චීන සංස්කෘතිය හරහා අනෙකුත් සංස්කෘතීන්හි වැදගත්කම අවබෝධකර ගැනීම. |
| විශ්ව දැනුම | 1. තමාගේ රටෙහි සහ චීනයේ සංස්කෘතික සංසිද්ධි පිළිබඳ අත්දැකිම් ලබා ගැනීම.<br>2. චීන භාෂාව සහ සංස්කෘතිය ඉගෙනුම මඟින් ලොව දෙස විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් බැලීමට පුහුණු වීම.<br>3. විශ්ව පුරවැසි භාවයේ අත්දැකීම් ලබා ගැනීම. |

http://www.purpleculture.net

# දෙවැනි පරිච්ඡේදය
# දෙවන අදියර
# අභිමතාර්ථ සහ පටුන

## 2.1 අරමුණු

ICCLE හි දෙවන පියවරෙහි ඉගෙනුම් ක්‍රියාවලියේ මූලික භාෂා උපකරණ දෛනික ක්‍රියාවන් උදෙසා මැනවින් භාවිත කල හැක. සරළ වාක්‍යයන් සරළ හැදින්වීම් සහ සරළ සන්නිවේදන හුවමාරු නිර්මාණය කරයි. එමඟින් චීන භාෂාව ඉගෙනුමට ආසාවක් සහ ආත්මශක්තියක් ඇති කරයි. එමෙන්ම සන්නිවේදන සම්පත්, ස්වර හික්මීම ආදී මූලික නිපුණතා ද චීනයේ ආරම්භක සංස්කෘතික භාෂාව, සංස්කෘතික දැනුම පිළිබඳ ජාත්‍යන්තර දර්ශනය කෙරෙහි වැටහීමක් ද ඇති කරනු ලැබේ.

## 2.2 භාෂාමය ඥානය

| දැනුම | විස්තරාත්මක අරමුණු |
|---|---|
| වාග් පුහුණුව | 1. චීන භාෂා උච්චාරණයේ වැදගත්කම දැනීම.<br>2. ස්වර වෙනස්වීම පිළිබඳ නිපුනත්වයක් ලබා ගැනීම.<br>3. සුදුසු උච්චාරණ භාවිතය සහ දෛනික කථනයේදී ස්වර භේදය හැඳින ගැනීම. |
| අක්ෂර සහ වචන | 1. චීන අක්ෂර 300 ක ස්ථාවර දැනුම.<br>2. ශබ්ද හැඳිනිම සහ එහි තේරුම දැන ගැනීම.<br>3. චීන අක්ෂරයන්හි ස්වරූපය සහ වචන අතර සම්බන්ධය අවබෝධ කර ගැනීම.<br>4. දෛනික සහ පාසලේදී භාවිත වන වචන 600 ක පමණ දැනුම. |
| ව්‍යාකරණ කරුණු | අවබෝධ කර ප්‍රගුණ කිරීම:<br>1. පොදු නාම, සර්ව නාම, ප්‍රශ්නාර්ථයක් ඇසීමේ සහ වාක්‍ය 2ක් එකතු කිරීමේ නාම පිළිබඳ දැනුමක් ලැබීම.<br>2. වෙලාව, ස්ථානය ආදිය ප්‍රකාශ කිරීමේ හැකියාව.<br>3. වාක්‍ය රටා හා ක්‍රියාකාරකම් සහ එහි ක්‍රියා විශේෂණ.<br>4. විස්තරාත්මක වගන්ති.<br>5. සුභ පැතුම් ප්‍රකාශන පිළිබඳව උසස් අවබෝධයක් ලබා ගැනීම. |
| සන්නිවේදන ක්‍රියාකාරකම් | 1. ප්‍රධාන සන්නිවේදන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධය. (විවිධ අවස්ථාවනට සුදුසු ආකාරයේ ආමන්ත්‍රණ පිළිබඳ දැනුම.)<br>2. සන්නිවේදන ක්‍රියාකාරකම් පරීක්ෂණ හැදින්වීම් පිළිබඳ සවිස්තර අවබෝධය සහ භාවිතය.<br>3. දෛනික සරල ක්‍රියාකාරකම් දියුණු කිරීම. |

http://www.purpleculture.net



| දැනුම | විස්තරාත්මක අරමුණු |
|---|---|
| තේමාවන් | 1. පුද්ගලික රුචිය සහ පවුල් ජීවිතය පිළිබඳ මාතෘකා දැන ගැනීම.<br>2. දිනපතා සහ විවේකයෙහිදී කරන ක්‍රියාකාරකම් පිළිබඳ සරළ මාතෘකා දැනීම.<br>3. විශ්ව විද්‍යාලයීය සහ වෘත්තීය ජීවිතය පිළිබඳ සරළ මාතෘකා දැනුම. |
| කථනය | ගුරුවර මගපෙන්වීම යටතේ.<br>1. ග්‍රන්ථයන්හි මුණගැසෙන වගන්ති අවබෝධ කර එමඟින් සුදුසු පරිදි දීර්ග ඡෙද නිර්මාණය කිරීම.<br>2. වාක්‍ය කොටස් සහ එහි ව්යරණ නිපුනත්වය ලැබීම.<br>3. චීන භාෂාවෙන් සහ මව් භාෂාවෙන් සිතීමේ සහ සම්බන්දතා පිළිබඳ වෙනස්කම් අවබෝධය.<br>4. වාචික සහ ලිඛිත ලෙස චීන භාෂාවේ හමුවන හැගීම් පිළිබඳ අවබෝධය. |

## 2.3 භාෂා හුරුව

| කුසලතා | | විස්තරාත්මක අරමුණු |
|---|---|---|
| භාෂා ව්‍යවහාර කුසලතා | | මෙය තුලින් තමාගේ පෞද්ගලික ජීවිතයට හා තමාගේ දවසේ වැඩ වලට සාමාන්‍ය හෝ සරල භාෂා ව්‍යාකරණ සම්බන්ධ කර ගැනීමට හැකිවීම. එමෙන්ම සන්නිවේදන කුසලතාවද වර්ධනය ද වේ. එමඟින් තමන්ව හදුන්වා දීම හෝ අන් අයව හදුන්වා දීමටද හැකි වන අතර යම් මාතෘකා පිළිබඳව ද කතා කිරීමට හැකියාව ලැබේ. තමන්ගේ හැගීම් (ස්තුති කිරීමට හෝ අගය කිරීමට) හා සිතුවිලි (හොඳ හෝ නරක) තේරුම් ගැනීමට සාමාන්‍ය වචන භාවිතා කිරීමෙන් විවිධ අවස්ථා වලදී සුභ පැතුම් හුවමාරු කරගැනීමටද හැකියාව ලැබේ. |
| විශේෂිත | ඇහුම්කන් දීම | තමන්ගේ පෞද්ගලික හා දවසේ වැඩ වලට චීන භාෂාවේ මූලික තොරතුරු සම්බන්ධ කර ගැනීමට හැකිවේ. අදාල තොරතුරු පන්ති කාමර වල ඇති අන්තර්ක්‍රියා හා ප්‍රතිචාර මත පහත සදහන් උපදේශන පරිදි තේරුම් ගත හැක.<br>1. පෞද්ගලික හා දවසේ වැඩ වලදී සංශිප්ත ප්‍රකාශන සම්බන්ධ කර ගැනීම.<br>2. සාමාන්‍ය වාක්‍ය විධි හා සුභ පැතුම් හුවමාරු කර ගැනීම.<br>3. සංශිප්ත ප්‍රශ්න, ප්‍රතිචාර, ඉල්ලීම්, ආයාචනා පෞද්ගලික හා සාමාන්‍ය ජීවිතයට සම්බන්ද කර ගැනීම.<br>4. ඉලක්කම්, වෙලාව, ස්ථාන, කතා කිරීමේදී භාවිතා කිරීම.<br>5. පන්තිකාමර විධාන. |

http://www.purpleculture.net



| කුසලතා | | විස්තරාත්මක අරමුණු |
|---|---|---|
| විශේෂිත | කථනය | ගැලපෙන ශබ්ද දෙකකින් නැවත වාක්‍ය නිර්මාණය, ප්‍රශ්න වලට සාමාන්‍ය උත්තර දීම. සන්නිවේදනයේදී අනිත් අය සමඟ පෞද්ගලික හා දවසේ සාමාන්‍ය ක්‍රියාකාරකම් වලට අදාල මාතෘකා කතා කිරීම.<br>1. තමුන් ගැන හෝ අනුන් ගැන සාමාන්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමේදී සාමාන්‍ය වචන මාලාවක් භාවිතා කිරීම.<br>2. සරල වචන හා වාක්‍ය විධි භාවිතා කරමින් අනිත් අය සමඟ පෞද්ගලික හා සාමාන්‍ය වැඩ වලදී ඊට සම්බන්ධ මාතෘකා කතා කිරීම.සරල ප්‍රශ්න ඇසීම හෝ පැහැදිලි උත්තර ලබාදීම.<br>3. පෙර ඉගෙන ගත් වචන හා වාක්‍ය විධි භාවිතා කරමින් සාමාන්‍ය උපදේශන හෝ සාමාන්‍ය ආයාචනා දීම වැනි දේ අනිත් අය සමඟ සමීප අවස්ථා වලදී කතා කිරීම.<br>4. විවිධ අවස්ථා වලදී සුදුසු ආකල්ප හා හැඟීම් ප්‍රකාශ කිරීම. |
| | කියවීම | සරල චරිත හඳුනා ගැනීමට හා වචන, වාක්‍ය හා කෙටි ග්‍රන්ථ උපාංග, වැඩසටහන් තේරුම් ගැනීමට හා කෙටි ග්‍රන්ථ තුලින් අදාල තොරතුරු එකතු කිරීම හා ඇතුලත් කිරීම ඇතුලත්ව.......<br>1. සාමාන්‍ය තොරතුරු උපාංග තුලින් එදිනෙදා ජීවිතයට හා පෞද්ගලික ජීවිතයට අවශ්‍ය පොදු අදහස හඳුනා ගැනීම.<br>2. සුබ පැතුම්. ස්තුති, හා ආරාධනා සමාජ මාර්ග තුලින් හඳුනා ගැනීම හා තේරුම් ගැනීම.<br>3. සලකුණු වල අර්ථය අනුමාන කිරීම.<br>4. සරල සටහන්, දැන්වීම්, වගු තේරුම් ගැනීම.<br>5. මතකයෙන් මූලික චරිත ලිවීමේ හැකියාව, නිවැරදි ක්‍රියා හා ක්‍රියා පිළිවෙල අනුව අලුත් වාක්‍ය සෑදීමට හැකි වීම. |
| | ලිවීම | 1. සරල වාග් මාලා භාවිතයෙන් තමාගේ ජීවිත වලට සුදුසු තොරතුරු ලබා දීම.<br>2. සරල වාග් මාලා භාවිතයෙන් ස්තුති කිරීමට, සමාව ගැනීම, සුභ පැතීමට හා සමු ගැනීමට වාක්‍ය භාවිතය.<br>3. තමන් ගැන, තමාගේ පවුල ගැන හෝ පෞද්ගලික ජීවිතයට සම්බන්ධ සරල තොරතුරු ලිවීම.<br>4. පෞද්ගලික ජීවිතයට සම්බන්ධ ප්‍රශ්න වලට කෙටි උත්තර ලිවීම. |

## 2.4 භාෂා පරිහරණ උපාය

| නිපුණතාවය | විස්තරාත්මක අරමුණු |
|---|---|
| ක්‍රියාකාරකම් | 1. චීන භාෂාව ඉගෙනීමේ උනන්දුව ඉහල දැමීම හා භාෂාව දියුණු කිරීම සඳහා ඊට අවශ්‍ය ක්‍රියාකාරකම් තුලින් උදව් කිරීම. |

http://www.purpleculture.net



| නිපුණතාවය | විස්තරාත්මක අරමුණු |
|---|---|
| ක්‍රියාකාරකම් | 2. චීන භාෂාව ඉගෙනීමේ උනන්දුව වැඩි කරීම සඳහා ඔවුන් සමඟ චීන භාෂාවෙන් කතා කිරීම හා අදහස් හුවමාරු කිරීම.<br>3. අවුල් සහගත තැන් විවිධ ක්‍රම මඟින් ඉවත් කිරීමට කියා දීම. |
| ඉගෙනීම | 1. චීන භාෂාව ඉගෙනීමේ අත්දැකීම්, භාෂාවේ අභ්‍යන්තරයට යොමු කිරීම.<br>2. චීන භාෂාවේ විවිධ ක්‍රම තුලින් භාෂාව ඉගැන්වීම.<br>3. මතක තබා ගැනීමේ ශක්තිය උපයෝගී කර ගනිමින් තොරතුරු ලබා ගැනීම හා ඒ තුලින් උපරිම ප්‍රතිලාබ ලබා ගැනීම.<br>4. තනි වචන භාවිතා කර වාක්‍ය නිර්මාණය කිරීම.<br>5. ඉගෙනීමේ පරිසරයක් නිර්මාණය කර ගැනීම, උපාංග තුලින් උපදෙස් ලබා ගෙන තමන්ගේ ගැටළු විසඳා ගැනීම.<br>6. ගුරුවරයාගේ මගපෙන්වීම යටතේ ඔවුන්ගේ ඉගෙනීමේ ක්‍රම හඳුනාගෙන හා ඔව්න්ට තමාගේ අධ්‍යාපනික ක්‍රමය සකසා ගැනීමට කියා දීම.<br>7. නැවත බැලීමට හා පසුගිය පාඩම් බැලීමට කියා දීම.<br>8. ඉගෙනීමට සුදුසු පරිසරයක් තොරා ගැනීමට ඉගැන්විම. |
| සන්නිවේදනය | 1. ශිෂ්‍යාවන්ගේ චීන භාෂාව ඉගෙනීම දියුණු කිරීමට සරල සමාජශීලි හා වැදගත් උපාංග භාවිතා කරමින් මඟ පෙන්වීම.<br>2. චීන භාෂාව පන්තියේ ළමුන්, ගුරුවරු හෝ යහළුවන් හෝ පිටත යහළුවන් සමඟ සන්නිවේදනය කිරීම හෝ හුවමාරු කර ගැනීම.<br>3. ගුරුවරයාගේ අධ්‍යනය යටතේ, ව්‍යවහාරික සන්නිවේදන භාෂාවට අදාල නැති (අභිරූපන හෝ අංග චලන) වචන භාවිතා කර සන්නිවේදන වැඩි දියුණු කර ගැනීම; චීන සංස්කෘතියේ පොදු ආචාර රීති වලින් අත්දැකීම් ලබා ගැනීම. |
| සම්පත් උපයෝගී කර ගැනීම | 1. ගුරුවරයාගේ අධ්‍යනය යටතේ, පාඩම් පොත භාවිතයට ඉගෙනීම, ශබ්ද කෝෂ භාවිතයට, පුස්තකාල භාවිතය හා අන්තර්ජාල දත්ත මඟින් අවශ්‍ය තොරතුරු හා සම්පත් සෙවීම.<br>2. ගුරුවරයා හරහා සම්පත් භාවිතා කිරීමට ඉගෙන ගැනීම, පන්තියේ යහළුවන්, පාසල් හෝ සන්නිවේදන මඟින් තොරතුරු සෙවීම. |
| ස්වයන්පාලනය | 1. සිසුන්ගේ පෞද්ගලික දැනුම වැඩි කිරීම.<br>2. චීන භාෂාව හා චීන සංස්කෘතික ඉගෙනීම තුලින් අනෙකුත් විෂයන් ඉගෙනුමට විශේෂ උනන්දුවක් ඇතිකරවන බව ඉගැන්විය යුතුය.<br>3. චීන භාෂාව හා චීන සංස්කෘතිය ඉගෙන ගැනීමේදී අනෙකුත් විෂයන් වල කරුණුද සම්බන්ධ කර ගැනීමට ඉගෙනිම.<br>4. චීන භාෂාව ඉගෙනීමේ වැදගත්කම හා අවශ්‍යතාවය කියා දීම.<br>5. මෙම අදියරේදී ඉතිහාසය, රට වැසියනේග් ඉතිහාසය, කලාශිල්ප හා අනෙකුත් දෑ අන්තර්ගත වේ. |